ජාතික සමාජ සංවර්ධන ආයතනය - 2019
-----------------------------------------------

1. මතය
------

1.1 තත්ත්වාගණනය කළ මතය
----------------------------

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-----------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්
----------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

--------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂවලදී පවත්වා අවසන් කර තිබුණු උපාධි පාඨමාලා 16 ක් සඳහා වැයකර තිබූ රු.2,962,450 ක් සහ 2014-2016 සහ 2016-2018 යන කාලපරිච්ඡේද තුළ පවත්වා අවසන්කර තිබූ උපාධි පාඨමාලා 07 ක් සඳහා වර්ෂය තුල ලැබී තිබුණු රු.3,737,250 ක් පාඨමාලා ආදායම් පූර්ව වර්ෂ ගැලපුම් ලෙස සමුච්චිත අතිරික්තයට ගැලපුම් නොකර වාර්ෂික මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයට ඇතුළත් කර තිබුණි. එම නිසා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.774,800 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | අධි ගණනය වී ඇති ආදායම 2020 ගිණුම් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දක්වා තිබුණි. | ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ පවත්වන ලද උපදේශන ඩිප්ලෝමා පාඨමාලා 13 ක් වෙනුවෙන් දිස්ත්‍රික් කාර්යාල වෙත ලැබි තිබූ රු.8,806,825 ක් වූ පාඨමාලා ආදායම් ගිණුම්වලින් අත්හැරී තිබුණි. මේ නිසා වාර්ෂික ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | පාඨමාලා ආදායම් හඳුනාගැනීමේ දෝෂයන් හේතුවෙන් මෙම අත්හැරීම සිදු වී තිබුණි. | වර්ෂයට අදාල සම්පූර්ණ ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතු වීම. |

### 1.5.3 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 770 | ආයතනය විසින් පාවිච්චියට ගත නොහැකි භාණ්ඩ රජයේ වෙනත් ආයතනයකට කිසිදු ප්‍රයෝජනයක් නොවෙතැයි සෑහීමකට පත්වුවහොත් විනා ඒවා විකිණීමට හෝ විනාශ කිරීමට නිර්දේශ නොකල යුතුය. කෙසේවුවද මෙම ආයතනය විසින් මුළු වටිනාකමරු.4,077,000 ක් වූ කාර්යාල උපකරණ අයිතම 42 ක් සහ වායුසමීකරණ යන්ත්‍ර 22 ක් සම්බන්ධව භාණ්ඩ සමීක්ෂණයක් සිදුනොකර වෙන්දේසි කර තිබුණි. | ජාතික සමාජ සංවර්ධන ආයතනය 2019 දෙසැම්බර් 16 දින සීදූව නව ආයතන පරිශ්‍රයට ගෙන යාමට තීරණය කිරීමෙන් පසු ආයතනයේ විශේෂ භාණ්ඩ සමීක්ෂණයක් 2019 නොවැම්බර් මාසයේදී පැවත්වන ලදි. එහිදී හඳුනාගන්නා ලද ප්‍රයෝජනයට ගැනීමට නොහැකි සහ විනාශ කළ යුතු භාණ්ඩ කමිටුවක් හරහා වෙන්දේසි කිරීම හා විනාශ කිරීම සිදුකරන ලදි. ඉන් පසුව මිල නියම කිරීමේ කමිටුව මඟින් මිල නියම කරන ලදි. | භාණ්ඩ ඉවත් කිරීමේදී මුදල් රෙගුලාසි විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ ii වැනි පරිච්ඡේදයේ 13.3<br><br>වගන්තිය | ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර 2018 ජූලි 07 දින සිට පුරප්පාඩුව පැවති අතර 2020 නොවැම්බර් 30 දින දක්වා ඒ සඳහා ස්ථිර නිලධාරියකු පත්කර නොතිබුණි. | රේඛීය අමාත්‍යාංශය මඟින් අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා අයදුම්පත් කැඳවීම 2019 අගෝස්තු මස පුවත්පත් දැන්වීම් මඟින් සහ ගැසට් නිවේදන මඟින් ප්‍රසිද්ධ ඉල්ලුම්පත් කැඳවන ලද නමුත් රජයේ සියලුම බඳවාගැනීම් අත්හිටුවා තිබූ බැවින් ස්ථිර නිලධාරියකු පත් කිරීම තවමත් සිදුකර ගැනීමට නොහැකි වී ඇත. | ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා ස්ථිර නිලධාරියක් පත් කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.5,626,205ක ඌණතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.9,915,227ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.15,541,432ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ආයතනයේ වෙනත් ආදායම අඩුවීම, පුද්ගලික පඩිනඩි හා පරිපාලන වියදම් වැඩිවීම සහ පාඨමාලා වියදම වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාජ සේවා විද්‍යාලය විසින් පවත්වන සමාජ වැඩ පිළිබඳ සිව් අවුරුදු උපාධි පාඨමාලාව සඳහා 2016 වර්ෂයේ සිට කණ්ඩායම් 04 ක් සඳහා සිසුන් 355 ක් ඇතුළත්කර ගෙන තිබුණු අතර වර්ෂය තුළ සිසුන්ගේ පන්ති වර්ජන හේතුවෙන් පන්ති කාමර දේශණ සහ විභාග පවත්වා නොතිබුණි. එසේම සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට පාඨමාලාවල සිසුන් සංඛ්‍යාවද 282 දක්වා අඩුවී තිබුණි. | සිසුන් දිගින් දිගටම දින 150 කට ආසන්න කාලයක් සිසුන්ගේ ඉල්ලීම් කිහිපයක් මුල් කර ගනිමින් පංති වර්ජනවල යෙදී සිටි අතර මෙම ක්‍රියාමාර්ගය පිළිබඳව සිසුන්ට වන බලපෑම පැහැදිලි කරන ලදි. සිසුන් විසින් පංති වර්ජනය කර තිබූ කාලයේදී අතපසු වූ දේශන පංති පැවැත්වීමේ කාල පරිච්ඡේද සංඛ්‍යාව වැඩි කර ආවරණය කළ අතර ඊට අමතරව මාර්ගගත ක්‍රමය(online) යටතේ පංති පවත්වා සිසුන්ගේ දේශන විෂයමාලා සම්පූර්ණ කිරීමට හැකි වන ආකාරයට ආවරණට කර ඇත. | සිසුන්ගේ අධ්‍යයන කටයුතු අඛණ්ඩව සිදු කිරීමට හැකිවන අයුරින් පාලන කටයුතු පවත්වා ගත යුතු වීම. |

### 3.2 අරමුදල් ඌන උපයෝජනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ සමාජසේවා විද්‍යාලයේ සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති පාඨමාලා 06 ක් පැවැත්වීම සඳහා රු.16,798,000 ක් ප්‍රතිපාදනය කර තිබුණු නමුත් එයින් පාඨමාලා 04 ක් පමණක් පවත්වා තිබුණි. එ අනුව රු.12,334,944 ක් හෙවත් සියයට 73 ක් ඌන උපයෝජිතව පැවතිණි. | සමාජ සේවා විද්‍යාලයේ සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති පාඨමාලා 06ක් පැවැත්වීමට පුරෝකථනය කර තිබුණද සිසුන් බඳවා ගැනීමටහැකි වූවත් එයින් පාඨමාලා 04ක් සඳහා පමණි. | සැළසුම්වලට අනුව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාජසේවා විද්‍යාලයේ අධ්‍යාපනය හදාරන සිසුන් **140** දෙනෙකුට ශිෂ්‍යාධාර ලබාදීම සඳහා රු.**132,800** ක්ද සිසුන් **500** කට වෘත්තීයමය සංවර්ධන අධ්‍යයන පුහුණුව ලබාදීම සඳහා රු.**750,000** ක්ද සමාජ වැඩ සටහන් විෂයමාලා සමාලෝචනය කිරීමට රු.**5,141,600** ක් සහ පාඨමාලා අවසන් කරන ලද සිසුන් ගේ ප්‍රගතිය පිළිබඳ පසු විපරම් කිරීම සඳහා වූ වැඩසටහනට රු.**1,000,000** ක් ප්‍රතිපාදනය කර තිබුණද එම වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි.මේ නිසා එම වැඩසටහන් වෙනුවෙන් වෙන්කරන ලද රු.**7,024,400** ක් වූ සමස්ථ ප්‍රතිපාදනම ඉතිරිකර තිබුණි. | සිසුන් විසින් පංතිකාමර දේශන සඳහා අදාල කාලය තුල සහභාගීවීම වර්ජනය කර තිබූ බැවින් සිසුන් **140** දෙනෙකුට වෙන්කරන ලද රු.**132,800** ක් වූ ශිෂ්‍යාධාර මුදල් ලබාදීම සිදුනොකරන ලදි.<br>සිසුන් **500**ක් බඳවා ගැනීමට අදාල වර්ෂය තුලදී සැලසුම් කර තිබුණද පාඨමාලාවට ඇතුලත්වීමේ විභාගයෙන් සමත් වී තිබූ සිසුන් **127** දෙනෙකු පමණක් බඳවා ගෙන තිබුණි. තවද, විෂයමාලා සමාලෝචනය සඳහා අභ්‍යන්තර කථිකාචාර්ය මණ්ඩලය යොදාගත් බැවින් එම මුදල වියදම් නොවුණු බවත් සිසුන් පංති වර්ජනයේ යෙදී සිටීම නිසා ප්‍රගතිය පිළිබඳ පසු විපරම් කිරීමට හැකියාවක් නොලැබුණු බැවින් එම රු.**1,000,000** ක මුදල වැයකර නොතිබුණි. | සිසුන් වෙනුවෙන් වෙන් කරනු ලබන ප්‍රතිපාදන උපරිම අයුරින් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ කිලිනොච්චිය, තලාව, පුත්තලම සහ රත්නපුර යන ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථාන සහ කොළඹ පුහුණු අංශයේ **2019/2020** උපදේශන ඩිප්ලෝමා පාඨමාලා **06** ක් පැවැත්වීමට රු.**4,875,375** ක් ප්‍රතිපාදනය කර තිබුණද එම පාඨමාලා පවත්වා නොතිබුණි. ඒ අනුව සම්පූර්ණ ප්‍රතිපාදනයම ඌන උපයෝජනයවී තිබුණි. ප්‍රමාණවත් හා විධිමත් දැනුවත් කිරීමේ වැඩ සටහන මගින් දැනුවත් කිරීම් සිදු නොකිරීම නිසා ප්‍රමාණවත් ශිෂ්‍ය සංඛ්‍යාවක් බඳවා ගත නොහැකිවීම මේ සඳහා හේතුවී තිබුණි. | **2019/2020** වර්ෂය සඳහා උපදේශන ඩිප්ලෝමා පාඨමාලා **06** ක් පුහුණු අංශය මඟින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළ තිබුණ ද එම වර්ෂය තුළ එකී පුහුණු පාඨමාලා පැවැත්වීමට නොහැකි වූයේ එම පාඨමාලා සඳහා ප්‍රමාණවත් ශිෂ්‍ය සංඛ්‍යාවක් සහභාගී වී නොතිබීම වේ. | ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානවල පවත්වන පුහුණු පාඨමාලා සම්බන්ධයෙන් දැනුවත් කිරීම් පිළිබඳව අවධානය සිදු කළ යුතු වීම. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ආයතනයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරු 02 ක් ද, කථිකාචාර්ය තනතුරු (1 සහ 11) 07 ක්ද, ජ්‍යෙෂ්ඨ පුහුණු නිලධාරී තනතුරු 01 ක් ද, පර්යේෂණ නිලධාරී 11,1 තනතුරු 04 ක්ද, පර්යේෂණ සහකාර නිලධාරී 03 ක් ද, ඉංග්‍රීසි උපදේශක තනතුරු 02 ක්ද වශයෙන් අධ්‍යයන කටයුතු වලට අදාලව තනතුරු 19 ක පුරප්පාඩු 2020 නොවැම්බර් 30 දිනට පැවතිණි. ඒ හේතුවෙන් ආයතනයේ මූලික අරමුණවූ පුහුණු පාඨමාලා පවත්වා ගැනීමට බාධාවක්වී තිබුණි. | මෙම තනතුරු සඳහා බඳවාගැනීමට 2019 සැප්තැම්බර් 12 දින අයදුම්පත් කැඳවූවද රජයේ සියලුම බඳවාගැනීම් නතර කිරීම හේතුවෙන් බඳවාගැනීමට නොහැකි විය. එමෙන්ම 2020 මැයි මස පාලක සභාවේ උපදෙස් පරිදි සියලුම බඳවාගැනීම් නව බඳවාගැනීමේ පරිපාටියට අනුව සකස් කර නැවත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියට යොමු කර ඇත. | ආයතනයේ අධ්‍යයන කටයුතු උපරිම අයුරින් පවත්වා ගැනීමට මෙම තනතුරු සඳහා බඳවා ගැනීම කඩිනම් කළ යුතු බව. |
| (ආ) | ආයතනයේ මූල්‍ය හා පරිපාලන තනතුරු 19 කින් තනතුරු 09 ක් පුරප්පාඩු පැවති අතර එම පුරප්පාඩු වලින් භාෂා පරිවර්තක සහ ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණ නිලධාරී තනතුරු 02 වර්ෂ 10 කාලයක් පුරප්පාඩුව පැවතිණි. | ආයතනයේ පුරප්පාඩු තනතුරු සියල්ල නව බඳවාගැනීමේ පරිපාටිය අනුමත වීමෙන් පසු බඳවාගැනීමට කටයුතු කරනු ලැබේ. | ආයතනයේ මූල්‍ය හා පරිපාලන කටයුතු විධිමත්ව පවත්වා ගෙන යාම සඳහා පුරප්පාඩු සඳහා කඩිනමින් බඳවා ගැනීම සිදුකළ යුතු වීම. |